# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2023
2025 සැප්තැම්බර් / ඔක්තෝබර්

මානවශාස්ත්‍ර පීඨය

## නාට්‍ය හා රංගකලාව
(නව නිර්දේශය)

**ග්‍රීක, රෝම සහ එලිසබතීන නාට්‍ය කලාව - DMAT 28214**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. කාව්‍යශාස්ත්‍රය කෘතියේ දැක්වෙන ට්‍රැජඩි (Tragedy) නාට්‍යයක මූලිකාංග මොනවාදැයි උදාහරණ දක්වමින් පෙන්වා දෙන්න.

02. ට්‍රැජඩි වීරයා (Tragic Hero) සතු ගුණාංග සහ ලක්ෂණ මොනවාදැයි සමාලෝචනය කරන්න.

03. ඊස්කිලස් ස්වකීය නාට්‍ය මගින් මූර්තිමත් කළේ 'මනුෂ්‍යා සහ දෙවියන් අතර ගැටුමය.' සාකච්ඡා කරන්න.

04. මීඩියා නාට්‍යය මගින් විවරණය කෙරෙන්නේ 'සාමාන්‍ය මිනිසාගේ චිත්ත සන්තානයයි.' සාකච්ඡා කරන්න.

05. ඇරිස්ටොෆානීස්ගේ කොමඩි නාට්‍යවල නිරූපණය කෙරෙන චරිත සතු සුවිශේෂී ලක්ෂණ මොනවාදැයි උදාහරණ ඇසුරින් පෙන්වා දෙන්න.

06. රෝම කොමඩි නාට්‍යවල ලක්ෂණ ප්ලෝටස්ගේ නාට්‍ය උදාහරණ වශයෙන් ගෙන පෙන්වා දෙන්න.

07. පහත දැක්වෙන චරිත අතරින් එක් චරිතයක් තෝරාගෙන එම චරිතයේ ක්‍රියාව සහ චින්තනය අතර ඇති සම්බන්ධය විශ්ලේෂණය කරන්න.
    (i) ඩෙස්ඩිමෝනා
    (ii) ඔතෙලෝ
    (iii) ඉයාගෝ

08. ෂේක්ස්පියර්ගේ ට්‍රැජඩි නාට්‍ය තත්කාලීන සමාජය පිළිබිඹු කළේද? සාකච්ඡා කරන්න.

******************************